# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1813/4 – 2013 ජූනි 03 වැනි සඳුදා – 2013.06.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: හපු/ඉඅත්/1/68.
ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4/3/8/201/1/පීසී/219.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත කෝරළේ අංක 63බී දියතලාව ග්‍රාම නිලධාරි වසමේ, දියතලාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක 28 අතිරේක 55 පත්‍ර 60 හා 2013.04.24 වැනි දින දරන නගර මැනුම් මූලික පිඹුරේ කැබලි අංක 1359 හා 1360 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1203 ක් පමණ වන දියතලාව පතන නමැති ඉඩම් කැබලි දෙක (02).

01. කැබලි අංක 1359
ඉඩමේ නම: දියතලාව පතන; ප්‍රමාණය: හෙක්. 0.0242.

02. කැබලි අංක 1360
ඉඩමේ නම: දියතලාව පතන; ප්‍රමාණය: හෙක්. 0.0961.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 17 වැනි දින පූ. භා. 9.00 ට හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ටී. පී. අනුර හේමකුමාර,
ප්‍රාදේශීය ලේකම්,
හපුතලේ.

2013 මැයි මස 29 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය,

06 – 372